ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023/03/09

පැමිණිලි අංකය : බී.ජ්. උපේක්ෂි මිය,
8 ඒ, රත්සිරි පටුමග,
බම්බලපිටිය, කොළඹ 04.

වගඋත්තරකරුවන් : 01 විදුහල්පති,
රාජකීය විදුහල,
කොළඹ 07.

02 අධ්‍යක්ෂ (ජාතික පාසල් ශාඛාව),
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

<u>පැමිණිලි අංකය : HRC/2698/21</u>

**පැමිණිලි පාර්ශවයේ කරුණු සැළකිරීම =:**

උක්ත පැමිණිලිකාරිය විසින් ඉහත පැමිණිලි අංකය යටතේ මාතව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇත්තේ, ඩී.පී. නතාර විද්‍යාභූෂණ නමැති තම දරුවා 2021 වසරේ කොළඹ රාජකීය විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ ඉදිරිපත් කර තිබූ අයදුම්පත්‍රය සම්බන්ධයෙන් පැවති සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 57 ක් ලබා ගත් බවත්, ඒ අනුව තම දරුවා රාජකීය විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කරගත හැකිවේ යැයි බලාපොරොත්තුවෙන් පසුවූවත් තාවකාලික ලේඛන ප්‍රසිද්ධ කිරීමේදී තම දරුවාගේ නම සඳහන් නොවීම මගින් තම දරුවා රාජකීය විදුහලේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර නොගන්නා බව අනාවරණය වීම මත අභියාචනා විරෝධතා මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ බවත්, එමගින්ද තමන්ට සහනයක් සලසා ගැනීමට හැකියාවක් නොවූ බවත්ය. එම වකවානුවේ ආචාර්ය උපාධිය සඳහා තම ස්වාමිපුරුෂයා සමග පවුලේ අය ජපානයට ගොස් සිටි බැවින්, තමන්




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த, மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர்: 011-2505521
ක්ෂණික / துரித அமைப்பு: 1996
වෙබ් / இணையம்: www.hrcsl.lk

වෙනුවෙන් සම්මුඛ පරීක්ෂණය සඳහා තම මව ඉදිරිපත් වූ බවත්, එම වසරේ රාජකීය විදුහලට ඇතුලත් කර ගන්නා කඩඉම් ලකුණට වඩා වැඩි ලකුණු ලබා සිටි තම දරුවා පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ පලමු ශ්‍රේණියට ඇතුලත් කර නොගැනීම මගින් වගඋත්තරකාර පාර්ශවයන් තම මූලික අයිතිවාසිකම් කඩවන ආකාරයෙන් කටයුතු කර ඇති බවත් ප්‍රකාශ කරමින් මේ සම්බන්ධව කඩිනම් විමර්ශනයක් සිදු කර සහනයක් සලසා දෙන ලෙස ඉල්ලා ඇත.

**වගඋත්තරකාර පාර්ශවයන්ගේ කරුණු සැළ කිරීම් =:**

**විදුහල්පති, කොළඹ රාජකීය විද්‍යාලය කරුණු සැළකිරීම**

පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කර ඇති විදුහල්පති, කොළඹ රාජකීය විද්‍යාලය පී.ඒ.එස්.පී. ජයලත් මහතා ප්‍රකාශ කර ඇත්තේ, පෙත්සම්කාරියගේ දරුවා පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ ඉදිරිපත් කර තිබූ අයදුම් පත්‍රය සම්බන්ධයෙන් පැවති සම්මුඛ පරීක්ෂණයේදී මුළු ලකුණු 57 ක් ලබා තිබූ බවත්, තාවකාලික හා පොරොත්තු ලේඛනය ප්‍රසිද්ධ කිරීමට පෙර 29/2019 චක්‍රලේඛයේ **9.3.3** වගන්තියෙහි දක්වා ඇති පරිදි අවස්ථා තුනකදී ස්ථානීය පරීක්ෂණයන් සිදු කර ඇති අතර. ඒ අනුව පෙත්සම්කාරිය විසින් බදු පදනම මත පදිංචිව සිටි බව සඳහන් 8 ඒ, රත්සිරි පටුමග, බම්බලපිටිය යන ලිපිනය දරණ නිවසට ගොස් ස්ථානීය පරීක්ෂණයන් සිදු කර ඇති අතර එහි කිසිදු අවස්ථාවක පෙත්සම්කාරිය හෝ පවුලේ අය එහි පදිංචිව සිටින බවට පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින් හට තහවුරු වී නොමැති බවයි.

2021 වසරේ පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ (සිංහල මාධ්‍ය) අයදුම්පත් 1108 ක් අතුරින් ළමුන් 120 ක් ඇතුලත් කරගෙන ඇති අතර. එම දරුවන් සියලුම දෙනාගේ පදිංචි ස්ථාන පරීක්ෂා කර බලා එම ඇතුලත් කර ගැනීම් සිදු කර ඇති බවත් සඳහන් කර ඇත. තවද අයදුම්කාරියගේ ස්වාමිපුරුෂයා එවකට උසස් අධ්‍යාපනය සඳහා විදේශගතව සිටි බවත් කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් ලංකාවට පැමිණීමට නොහැකි වූ බවත් දක්වා ඇත. මෙවැනි තත්වයන්ට අදාළ ව්‍යතිරේකී ප්‍රතිපාදන චක්‍රලේඛයේ සඳහන්ව නොමැති අතර, පාසල විසින් සිදු කර ඇත්තේ, චක්‍රලේඛ ප්‍රකාරව නියමිත කාලරාමුවට අනුව අදාළ සම්මුඛ පරීක්ෂණ සහ අභියාචනා විරෝධතා පරීක්ෂණ සිදු කර පදිංචිය තහවුරු කර ඇති අයදුම්කරුවන්ගේ දරුවන් පාසලට ඇතුලත් කර ගැනීම බවත්, කොවිඩ් තත්වය මත විදේශගතව සිටියදී ලංකාවට පැමිණීමට නොහැකිවීම නිසා අයදුම්කාරිය සිය මව සම්මුඛ පරීක්ෂණයට සහභාගි කරවූ බව ප්‍රකාශ කර ඇතත්, ස්ථානීය පරීක්ෂණ වලදී පැමිණිලිකාරියගේ මව හෝ පවුලේ වෙනත් සාමාජිකයින් නිවසේ පදිංචිව සිටින බවට තහවුරු වී නොමැති බවද වැඩිදුරටත් දක්වා ඇත. ඒ අනුව පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් කඩවන ආකාරයෙන් විදුහල්පති ලෙස තමා හෝ සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින් හෝ අභියාචනා විරෝධතා මණ්ඩල සභාපති හෝ සාමාජිකයින් කටයුතු කර නොමැති බව පෙන්වා දී ඇත.

අධ්‍යක්ෂ, ජාතික පාසල්, අධ්‍යාපන අමාත්‍යාංශය කරුණු සැළ කිරීම =:

මෙම පැමිණිල්ලට අදාලව සිදු කර ඇති වැඩිදුර විමර්ශනයේදී, අධ්‍යක්ෂ ජාතික පාසල්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, එම්.සී. පලාවෙල මිය සහභාගි වී ඇති අතර, එහිදී පරීක්ෂණ නිලධාරි විසින් සිදු කර ඇති විමසීම් වලට පිළිතුරු වශයෙන් ප්‍රකාශ කර ඇත්තේ, සභාපති, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සහ අභියාචනා විරෝධතා මණ්ඩල සාමාජිකයින් 29/2019 චක්‍රලේඛයේ ප්‍රතිපාදන පරිදි කටයුතු කර ඇති බව නිරීක්ෂණය වන බැවින් පැමිණිලි පාර්ශවයට සහනයක් සැලසීමට හැකියාවක් නොමැති බවත්ය. මෙම පැමිණිලිකරුවන් මේ සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති බව සඳහන් කර ඇතත්, එවැනි අභියාචනයක් ඉදිරිපත් කර නොමැති බව ජාතික පාසල් අධ්‍යක්ෂ කිත්සිරි ලියනගමගේ මහතා 2022-09-02 දිනැති ලිපියක් මගින්ද කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

විමර්ශනය =:

මෙම පැමිණිල්ලට අදාලව සිදු කර ඇති වැඩිදුර විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු අනුව, පැමිණිලි පාර්ශවය සිය පැමිණිල්ලේ සඳහන් ලිපිනයේ සිට තම දරුවා කොළඹ රාජකීය විද්‍යාලයේ 2021 වසරේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අයදුම් පත්‍රයක් ඉදිරිපත් කර මුළු ලකුණු 57 ක් ලබා ඇති බවත්, එම වසරේ එම ගණය යටතේ (සිංහල මාධ්‍යය) ලකුණු 56.6 ක් ලෙස කඩඉම් ලකුණු තත්වය සැලකිල්ලට ගෙන ඇති බවත් නිරීක්ෂණය වේ. කෙසේ වෙතත් වගඋත්තරකාර පාර්ශවය ප්‍රකාශ කරන ආකාරයට අවස්ථා තුනකදී සිදු කර ඇති ස්ථානීය පරීක්ෂාවන් හිදී පැමිණිලිකරුවන් බදු පදනම මත පදිංචිව සිටින බව පවසන ඉහත සඳහන් ලිපිනයේ නොසිටි බව අනාවරණය කරගෙන ඇත. ඊට අමතරව 29/2019 චක්‍රලේඛය මගින් ආවරණය නොවන අයදුම්කරුවන් සහ පවුලේ අය විදේශ ගතව සිටින අවස්ථා වලදී අනුගමනය කරන ක්‍රියාපටිපාටිය සම්බන්ධව ගැටළුවක් පවතින බව විදුහල්පතිවරයා ප්‍රකාශ කර ඇති අතර, පැමිණිලිකාරියගේ මව සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්ව ඇතත්, ස්ථානීය පරීක්ෂාවන් සිදු කර ඇති අවස්ථා තුනකදී එම මව හෝ වෙනත් පවුලේ සාමාජිකයින් එහි සිට නොමැති බව ප්‍රකාශ කර ඇත. ඒ සම්බන්ධව වැඩිදුර කරුණු දැක්වීම් වලදී පැමිණිලි පාර්ශවය චක්‍රලේඛයේ 3.5 වගන්තිය උපුටා දක්වා ඇත. එනම් "දරුවාගේ මව හා පියා විදේශ ගත ව සිටි අවස්ථාවක දී හෝ දෙමාපියන්ගෙන් එක් අයෙකු ජීවතුන් අතර නොමැති විට සහ අනෙක් පුද්ගලයා විදේශගතව ඇති විටක නීත්‍යානුකූලව භාරකාරත්වය පවරා නොතිබුණද තාවකාලිකව ළමයාගේ භාරකාරත්වය උසුලන්නාට ළමයාගේ දෙමව්පියන්ගේ නමින් ඉල්ලුම් කළ හැකි ය. එසේ වුව ද ඉහත කරුණු වලට අදාළ වූ ලිපි ලේඛන සලකා බලනු ලබන්නේ දරුවාගේ දෙමාපියන්ට අදාළවය. එසේ ම ළමයාගේ මව/පියා විදේශගත වී සිටීම හෝ ජීවතුන් අතර නොමැති වීම පිළිබඳව අදාළ සහතික මගින් සනාථ කළ යුතුය."

ඒ අනුව පැමිණිලි පාර්ශවය ප්‍රකාශ කර ඇත්තේ, අයදුම්කරුවන් විදේශගතව සිටියදී චක්‍රලේඛයේ ප්‍රතිපාදන නොමැති බව සඳහන් කිරීම සාවද්‍ය බවයි. එසේම වැඩිදුර විමර්ශනයේදී ස්ථානීය පරීක්ෂාවන්ට අදාළ සාක්ෂි ලේඛන ආශ්‍රයෙන් ඉදිරිපත් කරන ලෙස වගඋත්තරකාර පාර්ශවයට දන්වා ඇතත්, රාජකීය විද්‍යාලය පාර්ශවය ඒවා ලබාදීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ.

**නිරීක්ෂණ, නිගමන =:**

මෙම පැමිණිල්ලට අදාළව සිදු කර ඇති වැඩිදුර විමර්ශනයේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කර ඇති ලිඛිත සහ වාචික කරුණු සැලකිල්ලට ගැනීමේදී,

> පැමිණිලි පාර්ශවය පැමිණිල්ලේ සඳහන් ලිපිනයේ බදු පදනම මත පදිංචිව සිට තම දරුවා රාජකීය විදුහලේ පළමු ශ්‍රේණියට 2021 වසරේ ඇතුළත් කිරීමට පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බවත්,
>
> අදාළ සම්මුඛ පරීක්ෂණයේදී මුළු ලකුණු 57 ක් ලබා ඇති බවත්,
>
> එම වසරේ සිංහල මාධ්‍ය කඩඉම් ලකුණු ප්‍රමාණය ලකුණු 56.6 ක් බවත්,
>
> සම්මුඛ පරීක්ෂණ සහ අභියාචනා විරෝධතා පරීක්ෂණ අවස්ථාවන් වල දරුවා සහ දෙමාපියන් විදේශගතව සිට ඇති බව සහ දරුවාගේ මිත්තනිය එම පරීක්ෂණ වලට සහභාගි වී ඇති බවත්,
>
> පැමිණිලිකාරිය ඇතුළු පවුලේ සාමාජිකයින් කාලයක සිට අදාළ ලිපිනයේ පදිංචිව සිට ඇති බව වෙනත් ලේඛන වලින් සාක්ෂි සපයා ගතහැකි බව සහ අදාළ බදු ගිවිසුමද ඊට සාක්ෂි සපයන බවත් නිරීක්ෂණය වී ඇත.

**නිගමනය =:**

මෙම පැමිණිල්ල සම්බන්ධව සිදු කර ඇති වැඩිදුර විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු සහ ඉහත නිරීක්ෂණ අනුව විදුහල්පති රාජකීය විද්‍යාලය ඇතුළු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සහ අභියාචනා විරෝධතා මණ්ඩල සාමාජිකයින් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් කඩවන ආකාරයෙන් කටයුතු කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය =:

ඒ අනුව වගඋත්තරකාර පාර්ශවයන් පැමිණිලිකාරිය වෙත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් ලබාදී ඇති හිමිය ක්‍රියාත්මක කිරීම සර්ව සාධාරණව සිදුවිය යුතුබවට වන ව්‍යවස්ථාව උල්ලංඝනය වන ආකාරයෙන් කටයුතු කර ඇති බැවින් පැමිණිලිකාරියගේ දරුවා කොළඹ රාජකීය විදුහලට ඇතුලත් කර ගැනීම සඳහා ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් විදුහල්පති, කොළඹ රාජකීය විද්‍යාලය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023. 04 . 28 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධ පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ආචාර්ය විජිත් නානායක්කාර,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. Vijitha Nanayakkara
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත =: 01. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. අධ්‍යක්ෂ (ජාතික පාසැල්),
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/